**රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදල - 2015**

-----------------------------------------------------------------------------

ශ්‍රී ලංකා රේගුවේ රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. දෙපාර්තමේන්තුවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගෙන් ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

------------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

----------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

--------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුල වැඩ නිම කරන ලද සිද්ධි ලිපි ගොනු 19 කට අදාලව එකතුව රු.4,875,474 ක ශුද්ධ ආදායමක් මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දී ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය රු.416,520 ක් අඩුවෙන් ප්‍රතිපාදනය කර තිබුණි.

#### 2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රේගු ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව සමාලෝචිත වර්ෂය තුලදී දළ වශයෙන් රු.612,230,436 ක මුදලක් අරමුදලට බැරවිය යුතු වුවද සත්‍ය වශයෙන් බැරකර තිබුණේ රු.588,065,426 ක මුදලකි. ඒ අනුව රු.24,165,010 ක ආදායමේ අඩුවීමක් නිරීක්ෂණය වූ අතර ඒ සඳහා හේතු පැහැදිලි නොකෙරුණි.

(ආ) අරමුදලේ ලැබීම් හා ගෙවීම් වලට අදාලව භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් හා දෙපාර්තමේන්තු පොත් අතර පිළිවෙලින් රු.3,635,649 ක් හා රු.5,709,657ක වෙනසක් නිරීක්ෂණය විය.

## 3. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් අතිරික්තය රු.450,789,616 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා අතිරික්තය රු.394,048,926 ක් වූයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.56,740,690 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මේ සඳහා අරමුදලේ දණ්ඩන ආදායම සහ අල්ලාගත් භාණ්ඩ විකුණුම් ආදායම් පිළිවෙලින් රු.56,787,933 කින් හා රු.15,053,753 කින් ඉහළයාම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ රු.232,622,256 ක් වූ අරමුදලේ අතිරික්තය 2013 වර්ෂය වනවිට රු.478,770,293 ක් දක්වා වර්ධනය වුවද 2014 වර්ෂය වනවිට එය රු.394,048,926 ක් දක්වා පිරිහී තිබුණි. 2015 වර්ෂයේදී එය රු.450,789,616 දක්වා නැවත වර්ධනයක් දක්නට ලැබුණි. ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකිල්ලට

ගැනීමේදී 2011 වර්ෂයේ රු. 232,938,001 ක් වූ අරමුදලේ දායකත්වය 2013 වර්ෂය වනවිට රු.484,905,593 දක්වා වැඩි වුවද 2014 වර්ෂය වනවිට රු.426,861,292 දක්වා අඩුවී තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී එය රු.483,597,854 ක් දක්වා නැවත වැඩිවී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය.**

**4.1 කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

1869 අංක 17 දරන රේගු ආඥා පනතේ 153(ආ) වගන්තිය ප්‍රකාරව මෙම අරමුදලේ අරමුණු පහත පරිදි වේ.

විවිධ රේගු වැරදි සඳහා පනවනු ලබන දණ්ඩන මුදල් සහ රාජසන්තක කල භාණ්ඩ විකිණීමෙන් ලැබෙන මුදලින් සියයට 20 කට සමාන මුදල් ප්‍රමාණයක් රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදලට බැර කරනු ලබන අතර රේගු නිලධාරීන්ගේ කළමනාකරණ සඵලතා වර්ධනය කිරීම සඳහා දේශීය හා විදේශීය වශයෙන් වැය දැරීමත් අනතුරට ලක්වන නිලධාරීන්ට වන්දි ගෙවීමත් වේ.

(අ) ඉහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම සඳහා විධිමත් පුරෝකථනයකින් හා සැලසුමකින් තොරව රේගු ආඥා පනත ප්‍රකාරව වර්ෂ ගණනාවක සිට මෙම අරමුදලට මුදල් වෙන් කිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට අරමුදලේ සමුච්චිත ශේෂය රු.මිලියන 4,731 ක් වී තිබුණි. එය ඉකුත් වර්ෂයේ ශේෂයට වඩා රු.මිලියන 448 ක් හෙවත් සියයට 10.45 ක වැඩිවීමකි.

අරමුදලේ සමුච්චිත ශේෂය අඛණ්ඩ වර්ධනය සඳහා පහත සඳහන් හේතු මූලික ලෙස බලපා තිබුණි.

(i) රේගු බදු වංචාවන්ගේ පාලනයක් නිරීක්ෂණය නොවීම හා බදු වංචාවන්ගේ අඛණ්ඩ වර්ධනයක් නිරීක්ෂණය වීම.

ඉකුත් වර්ෂ 05 ක කාලය තුල අරමුදලට මුදල් ලැබී තිබුණු රේගු විමර්ශන සංඛ්‍යාවේ ඉහළ යාම හා රේගු වැරදිවල මූල්‍යමය වටිනාකම ඉහළ යාම පිළිබඳ දත්ත සමහරක් පහත දැක්වේ.

| **වර්ෂය** | **විමර්ශන සංඛ්‍යාව** | **රේගු වැරදිවල මූල්‍යමය වටිනාකමෙන් අරමුදලට වෙන් කල මුදල් ප්‍රමාණය රු.** |
|---|---|---|
| 2011 | 128 | 282,001,680 |
| 2012 | 183 | 362,419,680 |
| 2013 | 200 | 592,887,505 |
| 2014 | 258 | 516,223,741 |
| 2015 | 296 | 588,065,427 |

(ii) රේගු වැරදි සඳහා දණ්ඩන පැනවීමේ දී අහිමි වූ රජයේ බදු ආදායමද එම දණ්ඩනයේ කොටසක් ලෙස සැලකීම හේතුවෙන් නිලධාරීන්ට ගෙවනු ලබන ත්‍යාග මුදල් ප්‍රමාණයේ ඉහළ යාමක් මෙන්ම මෙම අරමුදලට වෙන්කරන මුදල් ප්‍රමාණයේ ඉහළ යාමක් නිරීක්ෂණය වීම.

(iii) වර්තමානයේ පවත්නා නිදහස් ආර්ථික ප්‍රතිපත්ති හේතුවෙන් ආනයනයන්ගේ හා අපනයනයන්ගේ ඇතිවී ඇති සංකීර්ණතාවයට ගැලපෙන අයුරින් රේගු ආඥා පනත හා අදාල අරමුදල්වල නෛතික විධිවිධාන විධිමත්ව හා කාලීනව සංශෝධනය වී නොතිබීම.

(ආ) සමාලෝචිත වර්ෂය තුල අරමුදලේ ආදායම රු.මිලියන 588 ක් වුවද අරමුදලේ මූලික අරමුණු වෙනුවෙන් වැය කර ඇති මුදල ආසන්න වශයෙන් රු.මිලියන 73 ක් විය. මේ අනුව පෙනී යන්නේ අරමුදලේ අරමුණු ඉටුකර ගැනීම සඳහා විධිමත් පූර්ව සැලැස්මකින් තොරව අඛණ්ඩව ප්‍රතිපාදන වෙන් කරන බවයි.

(ඇ) මෙම අරමුදලේ මූලික අරමුණු දෙකෙන් එකක් ලෙස රේගු නිලධාරීන් සිය රාජකාරිවල නිරත වීමේදී වන ආපදාවන්ට වන්දි ගෙවීම හඳුනාගෙන තිබුණද පරීක්ෂාවට භාජනය කරන ලද ඉකුත් වර්ෂ 05 ක කාලපරිච්ඡේදය තුල එවැනි කිසිදු වන්දි ගෙවීමක් නිරීක්ෂණය නොවුණි. ඒ අනුව එම අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් තවදුරටත් මෙම අරමුදලට අසාමාන්‍ය ලෙස මුදල් රැස්කිරීම විගණනයේදී ප්‍රශ්නකාරී කරුණක් විය.

(ඈ) ප්‍රධාන අරමුණුවලට පරිභාහිරව ජංගම නොවන වත්කම් මිලදී ගැනීම, වාහන නඩත්තුව හා ආරක්ෂක සේවා වැනි වැය විෂයයන් සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු.මිලියන 14 ක් වැයකර තිබුණි.

**4.2 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් අරමුලේ සම්පත්**

සමාලෝචිත වර්ෂයේ ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයිති ගොඩනැගිල්ලක් පින්තාරු කිරීම සඳහා ගොඩනැගිලි නඩත්තු වියදම් ලෙස රු.653,682 ක් කළමනාකරණ හා වන්දි අරමුදලෙන් වැය කර තිබුණි.

## 5. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අරමුදල්වල වාර්ෂික කාර්යසාධන වාර්තා හා මූල්‍ය ප්‍රකාශන, ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුලත ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2016 අප්‍රේල් 27 දිනදීය.

**5.2 අයවැය ලේඛනමය පාලනය**

අරමුදලේ ආදායම් විෂයයන් 02 ක් සඳහා අයවැය ගත ආදායම හා සත්‍ය ආදායම අතර සියයට 100 ක හා සියයට 34 ක විචලනයක් පැවතුණු අතර වියදම් විෂයයන් 02 කට අදාලව අයවැය ගත වියදම හා තත්‍ය වියදම අතර සියයට 78 ක හා සියයට 127 ක විචලනයක් පැවතුණි. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොමැති බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
| --- | --- | --- |
| (අ) | විදේශ පුහුණුව සඳහා නිලධාරින් තෝරාගැනීම. | විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කිරීමකින් තොරව විදේශ පුහුණු කටයුතු සඳහා නිලධාරීන් තෝරා ගැනීම. |
| (ආ) | ආදායම් රැස් කිරීම. | අරමුදලට ලැබිය යුතු ආදායම් හා ලැබී ඇති ආදායම් සැසඳීම සඳහා විධිමත් ක්‍රමවේදයක් නොමැති වීම. |